EXAMINATIONS
Institute of Indigenous Medicine
12 JUN 2019
University of Colombo

**INSTITUTE OF INDIGENOUS MEDICINE, UNIVERSITY OF COLOMBO**
**DEGREE OF BACHELOR OF AURVEDA MEDICINE AND SURGERY**
**FINAL YEAR FOURTH SPECIAL SUPPLEMENTARY EXAMINATION - May-June 2019**

**DESHIYA CHIKITSA**

**Date: 12.06.2019**

**Time: 9.00 am - 12.00 am**

---

**Answer all questions**

**Index No** |  |

**I කොටස ( පොදු කොටස)**

**1.**

i. නිල හා මර්ම සංඛ්‍යාත්මකව දක්වන්න. ( ලකුණු 02)

ii. නින්ද නොයන රෝගියෙකුට සහ වමනය වැලැක්වීමට නිල ඇල්ලීම සිදුකරන අයුරු දක්වන්න. ( ලකුණු 08)

iii. දේශීය වෛද්‍යවරයා නිල පිළිබඳ දැනුම චිකිත්සාව සඳහා යොදාගත් ආකාරය කෙටියෙන් පහදන්න. ( ලකුණු10 )

**2.**

i. 'හිරලය පහත් වීම' ලෙස දේශිය වෛද්‍යවරයා දුටු රෝග අවසථාව කුමක්ද? ( ලකුණු 04)

ii. ඉහත (i) හි රෝග අවස්ථාව සඳහා යෙදිය හැකි ප්‍රතිකාර විධි තුනක් දක්වන්න. ( ලකුණු 06)

iii. බෝවන රෝග වලක්වා ගැනීම සඳහා දේශීය වෛද්‍යවරයා අනුගමනය කරන ලද උපක්‍රම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. ( ලකුණු 10)

**II කොටස (සර්ප විෂ)**

**3.**

i. සර්ප දෂ්ඨයකදී සිදුකල හැකි ප්‍රථමාධාර විධි කවරේද? ( ලකුණු 04)

ii. 'මගුලේ යන්නන් දැකලා....' කවිය සම්පූර්ණකර එම ඖෂධය සදා ගන්නා ආකාරය පහදන්න.( ලකුණු 06)

iii. පත්තෑයෙකු දෂ්ඨ කල රෝගියෙකු ඔබ වෙතට පැමිණි විට ඒ සඳහා ඔබ නිර්දේශකරන ප්‍රතිකාර විධි දක්වන්න. ( ලකුණු 10)

## III. කොටස (දැවුම් පිළිස්සුම්)

**4.**

i. ද්‍රව දග්ධය හා රූක්ෂ දග්ධය අර්ථ දක්වන්න. ( ලකුණු 04)

ii. කුප්පි ලාම්පුවක් පෙරළීමෙන් අතක් පිළිස්සුනු රෝගියෙකු ඔබ වෙත පැමිණේ. එම රෝගියාට ප්‍රතිකාර කරන ආකාරය විස්තර කරන්න. ( ලකුණු 08)

iii. පිළිස්සුනු රෝගියෙකුගේ හෘදය ආරක්‍ෂා කිරීමට සහ පිපාසය වැලැක්වීමට යෙදිය හැකි ඖෂධ එක බැගින් දක්වා ඒවා පිළියෙල කරගන්නා ආකාරය දක්වන්න. ( ලකුණු 08)

## IV. කොටස (අක්ෂි රෝග)

**5.**

i. අභිෂ්‍යන්ද රෝගියෙකුට පහලවන ලක්‍ෂණ මොනවාද? (ලකුණු 06)

ii. අභිෂ්‍යන්ද රෝගියෙකුට පොදුවේ දිය හැකි ඖෂධ පද්ධතියක් වට්ටෝරු සහිතව විස්තර කරන්න. (ලකුණු 14)